මුතූර් **ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මුතූර් ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය,වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට මුතූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂයපථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂයපථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද 1.6.1 (අ) නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය

| | විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයයේදීරු.6,812,500ක වියදමින් සවිකරණ ලද සෝලා පවර් උපකරණ ඉඩම් හා ගොඩනැගිලි ලෙස ගිණුම්ගත කර තිබුණි. | SOLAR POWER පිරිවැය ඉදිරි වර්ෂයේ දී යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ ගිණුමේ එකතු කර නිවැරදි කරනු ලැබේ. | වත්කමේ පිරිවැය වටිනාකම එකතු කිරීමට අදාළ කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයයේ දී අරමුදල් රු. 1,170,000 වියදමින් ඉදිකරන ලද තෝප්පූර් උප කාර්යාල ගබඩා කයමර ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | එම |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මූතූර් සංස්කෘතික මධ්‍යස්ථානයට කළ වියදම් රු.661,100ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කරමින් පවතී. | එම |

### 1.6.2 විගණනයට ලිඛිත සාක්ෂි නොවීම

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 213,565,064ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි කාලයේදී ස්ථාවර වත්කම් ලේඛන සුදුසු සාක්ෂිත් ඉදිරිපත් කරනු ලැබේ. | ලියවිලි ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසිහාකළමනාකරණතීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ------------------ | -------------------- | -------------------------- | ------------------ |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්තික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(1),(2), (3) | වර්ෂ 02කට වැඩි රු. 2,805,888 ක කල්ඉකුත්වූතැන්පතු 75 ක් සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. | ආදායම් ගිණුමට මාරු කිරීමේකටයුතු කඩිනම් කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.29,323,360ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.33,728,379,ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ

| | ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිගය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 7,510,000 | 8,347,000 | 1,200,000 | 7,147,000 | 2,336,000 | 7,247,000 | 464,000 | 6,783,000 |
| (ii) | කුලී | 28,141,000 | 35,736,000 | 20,243,000 | 15,493,000 | 35,832,000 | 40,035,000 | 26,924,000 | 13,111,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,640,000 | 1,259,000 | 1,220,000 | 39,000 | 2,879,000 | 1,193,000 | 1,154,000 | 39,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,794,000 | 1,233,000 | 827,000 | 406,000 | 2,452,000 | 1,614,000 | 1,208,000 | 406,000 |
| | එකතුව | 41,085,000 | 46,575,000 | 23,490,000 | 23,085,000 | 43,499,000 | 50,089,000 | 29,750,000 | 20,339,000 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| **අවසන් දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු. 7,147,000ක් තිබුණද අයකිරිමට කටයුතු කර නොතිබුණි.** | **ඉදිරි කාලයේදී ඒවා ලබාගැනිමට කටයුතු කරනු ලැබේ.** | **පනතේ විධිවිධාන අනුව අදාළ කටයුතු කළ යුතුය.** |
| **(ආ) කුලී** | | |
| **අවසන් හිඟ ශේෂය වූ රු. 6,054,022ක** මුදල අයකිරිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | **ඉදිරි කාලයේදී ඒවා ලබාගැනිමට කටයුතු කරමින් පවතී.** | **පනතේ විධිවිධාන අනුව අදාළ කටයුතු කළ යුතුය.** |

### 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව සතු වෙළඳපොළ කඩකාමර වල කුලී වටිනාකම කාලීනව ඇස්තමේන්තු නොකිරිම නිසා සභාවට දළ වශයෙන් රු.1,500,000 මුදලක් වාර්ෂිකව අහිමි වෙමින් පවතී. | ඉදිරි කාලයේදී ප්‍රත්‍යාගණනය කර කඩවල් කුලියට ලබාදීමට අදාළ කටයුතු කරමින් පවතී. | ඇස්තමේන්තු කිරීමට කටයුතු කළ යුතුය. |

### 3.2 මෙහෙයුම් අකායර්ක්ෂමතා

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සභා බල ප්‍රදේශයට අයත් ගොඩනැගිලි අනුමැතිය ලබා නොගත් ගොඩනැගිලි හඳුනාගෙන දඩ මුදල් අයකිරීමටත් සහ ඉදිරි කාලයේදී ඉදිකරනු ලබන ගොඩනැගිලි වලටත් අනුමැතිය ලබාදීමට අදාළ කටයුතු සභාව විසින් සිදු කර නොතිබුණි.** | **ගොඩනැගිලිවලට අනුමැතිය ලබාදීමේ කටයුතු සිදුකරන බවත් අනුමැතිය ලබානොගෙන ඉදිකරන ලද ගොඩනැගිලිවලට දඩමුදල් අයකිරීමට කටයුතු සිදුකිරිමට නියමිත වේ.** | **අනුමැතිය ලබාදිමේ කටයුතු කඩිනම් කළ යුතුය.** |

**3.3** වත්කම් කළමනාකරණය

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

**3.3.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම**

| | | |
|---|---|---|
| **මුදල් රෙගුලාසි 315 සහ 316 වගන්ති ප්‍රකාරව , ආරක්ෂිත සේප්පුව** (Safe Locker) භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | **ආරක්ෂිත සේප්පුව** (Safe Locker) ලබාගැනීමට කටයුතු සිදුකිරීමට නියමිතය. | අදාළ කටයුතු කළ යුතුවේ. |

**3.3.2 නිෂ්ක්‍රීය වත්කම්**

| | | | |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේදී රු. 4,967,426 වටිනාකමින් ඉදිකරන ලද තෝප්පූර් කඩකාමර සංකීර්ණය කුලී ආදායම් ඉපැයීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | **ඉදිරි කාලයේදී ඒවා අලුත්වැඩියා කර කුලියට දීමට කටයුතු කරනු ලැබේ.** | ආදායම් ඉපැයීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේදී ජීව වායු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරිම සඳහා රු. 1,115,226 ක වියදමින් ඉදිකරන ලද ගොඩනැගිල්ල වර්ෂ 07 කට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව පැවතුණි. | ජීව වායු සැකසීම සඳහා වූ ගොඩනැගිල්ල ප්‍රමාණවත් තාක්ෂණික උපදෙස් සහ යන්ත්‍ර නොලැබීම නිසා ක්‍රියාත්මක නොවුණි. | -එම- |

**3.4 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | | |
|---|---|---|
| 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 2.8.4 ට පටහැනිව සමාලෝචිත වර්ෂයේ රු. 1,264,218 ක මුදලක වර්ග 12 භාණ්ඩ සභාව විසින් මිලදී ගෙන තිබුණි. | **ඉදිරි කාලයේදී මෙවැනි වැරදි ඇති නොවන ලෙස කටයුතු කරනු ලැබේ.** | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුත කළ යුතුය. |

**3.**5 මානව සම්පත් කළමනාකරණය

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සමාලෝචිත වෂර්යේ අවසන් දිනට පුස්තකාලයාධිපති තනතුරු 05 පුරප්පාඩු පැවතියද ඒවා පිරවීමට සභාව කටයුතු කර නොතිබුණි.** | **පුස්තකාලයාධිපති තනතුරු පුරප්පාඩු පිළබඳ විස්තර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යවා තිබේ.** | අදාළ කටයුතු කළ යුතුවේ. |

**3.**6 වාහන උපයෝජනය

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **සභාව භාවිතා කරනු ලබන වාහන 29 ජීව කාලය දීඝර් කිරිමට අවශ්‍ය වාහන නැවතුම් පොළවල් ඉදිකිරිමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.** | වාහන ආරක්ෂිත ලෙස තබා ගැනිමට විකල්ප වැඩ පිළිවෙලක් සකස් කරමින් සිටී. | වාහන ආරක්ෂා කර ගැනිමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** පාරිසරික ගැටළු

| විගණනනිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **1980 අංක 47 දරන ජාතික පරිසර පනත ප්‍රකාරව ආයතන 15 කට බලපත්‍ර ලබාදී නොතිබුණි.** | **පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා දීමට කටයුතු සිදුකරමින් පවතී.** | **පරිසර ආරක්ෂණ බලපත්‍රය ලබා දීමේ කටයුතු කඩිනම් කළ යුතුවේ.** |